ශීර්ෂය 293 -  රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට  රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා  ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා**  ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ සමඟ අනුරූප වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (ඇ) සහ 1.6.4 (අ) ඡේදවල නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 **(vi)** ප්‍රකාරව දෙපාර්තමේන්තුව අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව, | | |
| **(i)** වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද රු.1,689,299 ක වියදම් හා අනිකුත් ප්‍රධාන ලෙජර යටතේ දරන ලද වියදම් වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් එසේ නොදක්වා මුළු එකතුව වූ රු.6,995,106 ක් වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම් සේ ගැලපුම් ගිණුමේ ඇතුළත් කර තිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම් හා අනිකුත් ප්‍රධාන ලෙජර යටතේ දරන ලද වියදම් වෙන් වෙන්ව දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | චක්‍රලේඛයට අනුව වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළත් කර ඇති අතර, වැඩිපුර හර කිරීමක් නොවන බව කාරුණිකව සඳහන් කරමි. |
| **(ii)** වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද රු. 2,167,085 ක වියදම් හා අනිකුත් ප්‍රධාන ලෙජර යටතේ දරන ලද වියදම් වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් එසේ නොදක්වා මුළු එකතුව වූ රු.5,399,822 ක් වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම් සේ ගැලපුම් ගිණුමේ ඇතුළත් කර තිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම් හා අනිකුත් ප්‍රධාන ලෙජර යටතේ දරන ලද වියදම් වෙන් වෙන්ව දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම් චක්‍රලේඛයට අනුකූලව සඳහන් කර ඇති අතර, වැඩිපුර බැර කිරීමක් සිදු වී නොමැති බව සඳහන් කරමි. |
| (ආ) මැතිවරණ රාජකාරී වෙනුවෙන් නිලධාරින්ට ගෙවන ලද එහෙත් ප්‍රතිපූරණය නොවූ රු. 820,769 ක මුදල වෙනුවට අක්මුදල් ගැලපුම් ගිණුමේ ශේෂය රු. 571,801 ක් ලෙස දක්වා එම ගිණුම තුළනය කර තිබුණි. මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ වර්ෂය අවසානයේ ශේෂය අක්මුදල් ගැලපුම් ගිණුමට ගෙන ගොස් නොතිබීම නිසා මෙම වෙනස සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ ශේෂය ඇතුළත් කර අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කළ යුතුය. | මෙය සදොස් ගැලපීමක් නොවන අතර මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ අග්‍රිම ශේෂය අග්‍රිම ගිණුමේ ශේෂය සමඟ සමාන නොවන බැවින් අග්‍රිම ගැලපුම් ගිණුම සකස් කරන අතර, මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ හා අග්‍රිම ගැලපුම් ගිණුමේ ශේෂය අග්‍රිම ශේෂය වන රු. 820,768.89 හා සැසඳේ. |

**1.6.2** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණවල වටිනාකම භාණ්ඩාගාරයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ සමුච්චිත වාර්තාව/(**SA 82)** අනුව රු.768,602,278 වුවද, දෙපාර්තමේන්තු පොත් අනුව රු. 802,507,077 ක් ලෙස දැක්වීම නිසා රු. 33,904,799 ක නොසැසඳු ශේෂයක් නිරීක්ෂණය විය. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තා සැසඳීම් කර යාවත්කාලිනව පවත්වා ගත යුතු වීම. | දේපළ පිරියත හා උපකරණ වර්ගීකරණ ලේඛනයේ ඇතුළත් වී නොතිබුණ බැවින් සඳහන් නොකරන ලද අතර එය නිවැරදිව වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට සඳහන් කර ගන්නා ලදි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව රු. 3,490,748 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ6) රු. 1,167,041 ක් ලෙස සටහන් කිරීම නිසා රු. 2,323,707 ක නොසැසඳු ශේෂයක් නිරීක්ෂණය විය. | සියලුම ස්ථාවර වත්කම්වල නිවැරදි අගයන් සටහන් විය යුතු වීම. | දේපළ පිරියත හා උපකරණ, වර්ගීකරණ ලේඛනයේ ඇතුළත් වී නොමැති බැවින් සඳහන් කර නොමැති අතර, නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(ඇ)** | කොන්ත්‍රාත්කරුවකුට මුදල් ගෙවීමේදී සියයට **10** ක රඳවාගැනීම් වැඩිපුර සටහන් කිරීම නිසා පොදු තැන්පත් ගිණුමේ ගෙවිය යුතු රඳවා ගැනීම් රු. **170,068** ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | ගෙවීම් වවුචර් පිළියෙල කිරීමේදී නිසි පරීක්ෂාවකට ලක්කළ යුතු වන අතර ගිණුම්වල අවසාන ශේෂ සම්බන්ධයෙන් නිවැරදි තහවුරුවක් තිබිය යුතු වීම. | මෙම රඳවා ගැනීම් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ඈ) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (**SPEnDP**) වසා දැමීමෙන් පසු අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුවේ මොනරාගල ප්‍රාදේශිය කාර්යලයට ලබා දී ඇති මෝටර් බයිසිකල් 16 පවරා ගෙන ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම්, ලේඛනයක සටහන් විය යුතුවේ. | ව්‍යාපෘතිය යටතේ ලබා දුන් මෝටර් බයිසිකල් 16 ක් මෙම දෙපාර්තමේන්තුවේ රබර් සංවර්ධන නිලධාරීන් වෙත ලබා දී ඇත. මෙම වත්කම්මල වටිනාකම ඉදිරියේදී වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කිරීමට කටයුතු කරන බව. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගෙන් අයවන පොලී ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වූ වෙනත් ලැබීම් ලෙස දැක්විය යුතු වුවත් එය ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස සැලකීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.1,689,868 ක් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. | රජයේ නිලධාරීන්ගෙන් අයවන පොලී ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වූ වෙනත් ලැබීම් ලෙස දැක්විය යුතු වීම. | පොලී ආදායම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස සඳහන් කිරීම නිසා ආදායම් නොවන වෙනත් ලැබීම් අඩුවෙනුත් සටහන් වී ඇත. එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. ආදායම් නොවන ලැබීම් වල සඳහන් විය යුතු පොලී ආදායම ආයෝජන ආදායමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් වීම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ඇප ලේඛනය<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | මු.රෙ. 891(1) ප්‍රකාරව සේවක ඇප තැම්පතු ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබූ බවට සාක්ෂි සොයාගත නොහැකි විය. එහෙත් මින් ඉදිරියට සේවක ඇප තැම්පතු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) හානි පිළිබඳ ලේඛනය<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ** 16(2) වගන්තිය ප්‍රකාරව | සෑම අස්ථිත්වයක් විසින්ම මූල්‍ය ප්‍රකාශන සමඟ රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්වයන් වාර්ෂික කාර්ය සාධන වාර්තාද ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතු යුතු වීම. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන 16.2 වගන්තියට අනුව ඉදිරිපත් කල යුතු මූල්‍ය ප්‍රකාශ හා කාර්යසාධන වාර්තාව වෙන් වෙන් වශයෙන් මේ වන විට ඉදිරිපත් කර ඇත. ඉදිරි වසරේදී මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරමි. |
| (ආ) 2008 අංක 10 හා 2011 අංක 13 දරන පනත්වලින් සංශෝධනය කළ 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත | දෙපාර්තමේන්තුව විසින් අය කළ යුතු රු. 25 ක මුද්දර බදු අය නොකළ අවස්ථා තිබුණි. | පනතේ දැක්වෙන පරිදි මුද්දර බදු අය කළ යුතු වීම. | නිරීක්ෂණයට ලක් වූ මුද්දර බදු අය නොවූ ගෙවීම් වලට අදාළව රු.25/- වටිනාකමින් යුතු මුද්දර ගෙවීම් වවුචර වල ඇලවීම සඳහා අදාළ නිලධාරීන්ට දන්වන ලද අතර, එම ගෙවීම් වවුචර නිවැරදි කිරීමට කටයුතු කරමි.<br>එසේම ඉදිරියේදී ඉදිරිපත් වන ගෙවීම් වවුචර්පත් වලින් නියමිත පරිදි මුද්දර ගාස්තු අය කිරීමෙන් පසු ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මු.රෙ. 1645 (අ) | ක්‍රමවත් හා විධිමත් ලෙස වාහන ලොග් සටහන් පවත්වා නොතිබුණි. | වාහන සම්බන්ධයෙන් වූ ලොග් පොත්වල ඇතුළත් කළයුතු සියලු සටහන් ඇතුළත් කළ යුතු වීම. | ක්‍රමවත් සහ විධිමත් ලෙස වාහන ලොග් සටහන් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |
| (ii) මු. රෙ. 1646 | වාහන භාර නිලධාරීන් විසින් මාසයකට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම 268(අ) පොදු ආකෘතියේ ලියන ලද මාසික සාරාංශයේ මුල් පිටපතක් සමඟ, දෛනික ධාවන සටහන්ද ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් වාහන 37 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට මාසික සාරාංශයේ පිටපතක් සහ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත එවීමට කටයුතු කළ යුතු වීම. | 268(අ) පොදු ආකෘතියේ ලියන ලද මාසික සාරාංශයේ මුල් පිටපතක් සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන** | | | |
| (i) 1985 මැයි 10 දිනැති අංක 289 හා 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවත්, ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලයක රාජ්‍ය ලාංඡනය යොදා නොමැතිව වාහන ධාවනයේ යොදවා තිබූ අවස්ථා පැවතුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව සෑම වාහනයකම රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම යෙදීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රධාන කාර්යාලයේ සහ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයේ වාහනවල ආයතනයේ නම හා රාජ්‍ය ලාංඡනය යෙදීම සම්බන්ධව කටයුතු ආරම්භ කර ඇත. |
| (ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව | චක්‍රලේඛ උපදෙස් අනුව ඉන්ධන පරීක්ෂාවන් කළ යුතු වීම. | වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව පරීක්ෂා කරන ලෙස ප්‍රාදේශීය කාර්යාලවල අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති අතර, ඒ අනුව දැනට එම පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. |

නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, ප්‍රාදේශීය කාර්යාල 04 ක් විසින් වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව පරීක්ෂාවක් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්ය නිම කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ලබා දී තිබූ එකතුව රු.253,320 ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම 18 ක් පියවීම සඳහා දින 11 ත්, දින 95 ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි. | රෙගුලාසිවලට පටහැනිව කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XLVII** පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අතුරු අග්‍රිමයන් ලබා ගන්නා නිලධාරීන්, අදාළ කාර්යය නිමවූ විගස මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව පියවීම් සිදු කළ යුතු බවට දැනුවත් කරන ලද අතර, ඉදිරියේදී ගනු ලබන අතුරු අග්‍රිමයන් පියවීම් නිසි අයුරින් සිදු වන්නේ දැයි පරීක්ෂාවෙන් සිටීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. |

## 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්ම වූ චෙක්පත් එකතුව රු. 104,115 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව මාස 06ට වැඩි නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | 2019 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මාස 06 ඉක්මවූ චෙක්පත් 23 හී සඳහන් රු. 213,164.00 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කිරීමෙන් පසුව ඉතිරිවී ඇති මුදල 104,115.87 කි. ඒ මුදල සඳහා ද මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කරන ලෙස දන්වා ඇති අතර, නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **සැලැසුම් කිරීම**

**-----------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත්, එහි 3 (ආ) ඡේදය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර සහ අක් මුදල් අවශ්‍යතා සැලැස්ම හා ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුලත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදි වූත් සම්පූර්ණ වූත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වීම. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව 2019 ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තරයක් ඇතුළත් කර නොමැති බව පිළිගනිමි. ඉදිරි වර්ෂවල සිට එම තොරතුරු ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 පරිදි වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.<br>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මද **2019** වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන අවස්ථාවේදී ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කිරීමට කටයුතු කරමි. |

**3.2** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කුඩා රබර් වතුහිමියන් ගේ හා වැවිලි සමාගම්වල පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 870 ක හා 900 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණද ඉන් නැවත වගාකර තිබුණේ ඉඩම් හෙක්ටයාර් 578 ක හා හෙක්ටයාර් 463 ක පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය පිළිවෙලින් සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 34 ක් හා සියයට 49 ක් වී තිබුණි. | ඉටු කළ ප්‍රමාණය සැලසුම් කළ ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 66 ක් හා සියයට 51ක් වුවද, ක්‍රියාකාරී සැලැස්ම මගින් සැලසුම් කළ වගා ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වතු සමාගම් එම ඉලක්ක ගත ප්‍රමාණයෙන් හෙක්. 462.84 ක් හා කුඩා රබර් වතු ඉලක්ක ගත ප්‍රමාණයෙන් හෙක්. 577.64 ක් ලෙස පැළ සිටුවා ඇති බවත් ඒ අනුව ඉටු කළ ප්‍රමාණය සැලසුම් කළ ප්‍රමාණයෙන් පිළිවෙලින් 53% ක් හා 64% ක් වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව ඉඩම් හෙක්ටයාර් 350 ක රබර් වගා කිරීමට සැලසුම්කර තිබුණද වගාකර තිබුනේ ඉඩම් හෙක්ටයාර් 215 ක පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 39 ක් වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට මගින් සැලසුම් කළ වගා ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සහ නොවූ මහ පරිමාණ නිෂ්පාදන කරුවන් විසින් සාපේක්ෂ වාසි න්‍යායට අනුව අවම මුදලකට රබර් අමුද්‍රව්‍ය ආනයනය කිරීම නිසා දේශීය රබර් ගොවියාට සාධාරණ මිලක් නොලැබීම හේතුකොට ගෙන නව සහ නැවත වගාව සඳහා රබර් ගොවීන් පොළඹවා ගැනීමට අපහසු වේ. එම නිසා නැවත රබර් වගාවට යොදවා ගත හැකි ඉඩම් ලාභ ලැබිය හැකි වෙනත් වාණිජ බෝග සඳහා යෙදවීම මෙන්ම මෙම කන්නය තුළ පැවති අධික වර්ෂාව ද නැවත වගා සහ අලුත් වගා සැලසුම් කළ පරිදි අදාළ ප්‍රතිශතයන් කරා ලඟා කර ගැනීමට නොහැකිවීමට හේතුවී ඇති බව කරුණිකව පෙන්වා දෙමි. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රබර් තොරතුරු කළමනාකරණ පද්ධතිය සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කර නිමකිරීමට 2016 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වුවද, මූලික අදියර ආරම්භ කිරීම ප්‍රමාද වීම නිසා නිම කිරීමේ කාලය 2017 දක්වා දික්කර ගිවිසුම සංශෝධනය කර තිබුණි. එහෙත් එම මෘදුකාංගය 2020 මැයි වන විටත් සම්පූර්ණ වී නොතිබුණ අතර ඒ වෙනුවෙන් රු. 17,453,971 ක වියදමක් දරා තිබුණි. | අදාළ මෘදුකාංගය කඩිනමින් සංවර්ධනය කර නිමකිරීම කළ යුතු වීම. | රබර් තොරතුරු කළමනාකරණ පද්ධති (RIMS) වැඩසටහන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) උපදේශකත්වය යටතේ ඊ-රාජ්‍ය ව්‍යාපෘතියක් වශයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක කරන ලදි.<br>රජයේ උපදේශන සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව අමාත්‍යාංශ උපදේශන සේවා ප්‍රසම්පාදන කමිටුවේ තීරණ අනුව Price Waterhouse Coopers (PWC) ආයතනය වෙත රබර් තොරතුරු කළමනාකරණ පද්ධති (RIMS) මෘදුකාංග සංවර්ධනය කිරීම පවරන ලදි.<br>පද්ධතියේ අවශ්‍යතා හඳුනාගැනීමේ කාලසීමාව තුල PWC ආයතනය විසින් මෙම වැඩසටහනේ මූලික අදියර ආරම්භ කිරීමේ යම් ප්‍රමාදයක් ඇති වූ බවත්, නැවත වරක් අවශ්‍යතා හඳුනාගැනීමේ (Requirement Analysis) කාල සීමාවන් දීර්ඝ කිරීමෙන් අනතුරුව PWC ආයතනය විසින් මෙම RIMS වැඩසටහනේ සංවර්ධන කටයුතු ආරම්භ කල බවත් සඳහන් කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෙනත් ආයතන සතු නිල නිවාස 24 ක් සමාලෝචිත වසරවන විටද දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර නිල නිවාසවල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෙනත් ආයතන සතු නිල නිවාස දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට අදාළ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් ආයතන මඟින් සිදු කරමින් පවතී. |
| (ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී බත්තරමුල්ල ප්‍රදේශයෙන් රු.මිලියන 59.3 ක් ගෙවා මිල දී ගත් පර්චස් 75 ක ඉඩම එම කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි. | ප්‍රධාන කාර්යාලය වෙනුවෙන් වාර්ෂික බදු කුලිය රු. මිලියන 45 කට අධික මුදලක් දැරීමට සිදුවන බැවින්, ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම තුළින් එම මුදල් ඵලදායීව යොදා ගත හැකිවීම. | දෙපාර්තමේන්තුව සතු බත්තරමුල්ලේ පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියෙන් දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව පවරා දී ඇත්තේ මෑතකදී ය. ඒ අනුව ඉදිකිරීම් කටයුතු සම්බන්ධව ඉදිරි කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධති කළමනාකරණ වැඩසටහන අපේක්ෂිත කාලසීමාවේ අවසන් කර ගැනීමට නොහැකිවීම නිසා තොරතුරු පද්ධතියට සෘජුව සම්බන්ධ වීමට නියමිත නිලධාරින් වෙත ලබාදීමට වසරත් වසර 02 ත් අතර, කාලය තුළ මිලදී ගත් රු. 6,571,732 ක් වටිනා පරිගණක හා පරිගණක උපාංග ගබඩාවේ රඳවාගෙන තිබුණි. | RIMS තොරතුරු පද්ධතිය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සර්වර් පහසුකම් යටතේ ස්ථාපිත කර නොතිබියදී ක්‍රියාත්මක මට්ටමේදී අවශ්‍යවන පරිගණක හා පරිගණක උපාංග වැනි තාක්ෂණය සමඟ වේගයෙන් වෙනස්වන උපකරණ මිලදීගැනීම ඵලදායී නොවේ.එවැනි ගනුදෙනුවලින් වැළකිය යුතු වීම. | (RIMS) වැඩසටහන 2017 වර්ෂයේදී නිමවා අවසන් කිරීමට සැලසුම් කර තිබූ අතර ඉන් අනතුරුව ප්‍රාදේශීය කාර්යාල අනුව නිලධාරි පුහුණු සැසි පැවැත්වීමට නියමිතව තිබුණි.<br>RIMS වැඩසටහනේ පුහුණු සැසි නියමිත කාලය තුල පවත්වා අවසන් කිරීමට අපොහොසත් විය.<br>2018 වර්ෂයේදී RIMS වැඩසටහන පරීක්ෂා කිරීම් කටයුතු වලදී, මෘදුකාංග පද්ධතියේ කායීක්ෂමතාව අඩු වී ඇති බවත් එයට පිළියම් වශයෙන් මෙම RIMS තොරතුරු පද්ධතිය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සර්වර් පහසුකම් යටතේ ස්ථාපිත කල යුතු බවත් යෝජනා වූ අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ICTA ආයතනය වෙත කිහිප වරක්ම ඒ පිළිබඳව ඉල්ලීම් කරන ලදි.<br>කාර්යාල තුල රාජකාරි කරන නිලධාරින් සඳහා Laptop Computers නිකුත් කිරීම ආරම්භ කිරීමත් සමඟම ක්ෂේත්‍ර රාජකාරි සිදුකරන මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධාරින් වෙනුවෙන් ලබා දීම සඳහා ICTA ආයතනයේ නිර්දෙශය අනුව Tablet පරිගණක යන්ත්‍ර (TABs) 100 ක් මිල දී ගැනීම 2018 වර්ෂයේදී සිදු කරන ලදි.<br>යම් සැලකිය යුතු ප්‍රමාදයකින් අනතුරුව 2019 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන නියෝජිතායතනය විසින් Production සර්වර් පහසුකම් ලබා දෙන ලදි. RIMS මෘදුකාංග පද්ධති සංවර්ධනය කරනු ලැබූ Price Waterhouse Coopers (PWC) ආයතනය හදිසියේ රජයේ ආයතන වල පරිගණක හා තොරතුරු පද්ධති සංවර්ධන කටයුතු වලින් ඉවත් වන බවට ලිඛිතව දන්වා ඇති අතර RIMS ව්‍යාපෘතියේ අවසන් අදියරේ ඇති පරීක්ෂා කිරීම් හා නඩත්තු කටයුතු ICTA ආයතනයේ උපදේශකත්වය යටතේ රජයේ උපදේශන සේවා ප්‍රසම්පාදන |

| | | | |
|---|---|---|---|
| | | | ක්‍රියාවලියට අනුකූලව වෙනත් සුදුසු ආයතනයක් තෝරා ගැනීමට තීරණය කර ඇති අතර මේ සඳහා අනුමැතිය ICTA ආයතනයෙන් ලබා දී ඇත.<br>බෙදා දීමට ඉතිරිව ඇති Laptop Computers, Computer Printers හා Tablet පරිගණක නිලධාරීන් වෙත බෙදා දීම සඳහා ලේඛන සකස් කර ඇති අතර නොපමාව එම උපකරණ බෙදා අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>සියලු උපකරණ වසර 03 ක වගකීම් කාලයක් සහිතව මිල දී ගත් බැවින් මේ වන විට කිසිදු පරිගණකයක හෝ උපාංගයක වගකීම් කාලය ඉකුත්ව නොමැති බවද කාරුණිකව අවධානයට යොමු කරමි. |
| (ඇ) | වසරත් වසර 03 ත් අතර, කාලය තුළ ඡායාපිටපත් (Photo copy) යන්ත්‍ර හා මුද්‍රණ (Printers) යන්ත්‍ර වෙනුවෙන් මිලදී ගත් රු.802,902 ක් වටිනා ටෝනර් හා කාට්රිඩ් 90 ක් ගබඩාවේ පැවතුණි. | මිලදී ගැනීම් කිරීමේදී අවශ්‍යතා ඇස්තමේන්තු කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | මෙම ටෝනර් සහ කාට්රිජ් වලින් වර්තමානයේ භාවිත කරනු ලබන්නේ NPG 28 Canon 303, Epson LQ 2190 සහ Laser Jet Toner 1020 පමණි. අනෙකුත් ටෝනර් සහ කාට්රිජ් වර්ග හයට (6ට) අදාළ ඡායාපිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම නිසා භාවිතයෙන් ඉවත් කර ඇති බැවින් ඉතිරිය පෙන්නුම් කරයි.<br>එසේම ටෝනර් සහ කාට්රිජ් 2018.01.01 දිනට පසු මිළදී ගෙන ඇති අතර, එම ටෝනර් සහ කාට්රිජ් වර්තමානයේ දෙපාර්තමේන්තුවේ භාවිත වන ඡායාපිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර සඳහා යොදන ඒවා බව කාරුණිකව සඳහන් කරමි. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩුබාහිරාදිය බාර ගැනීම හෝ බාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් | රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ | මු. රෙ. 880 ප්‍රකාරව ඇප ලේඛණයක් සකස් කිරීම සඳහා කටයුතු කරමින් පවති. |

| | | | |
|---|---|---|---|
| | බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට ඇප තැබිය යුතු වුවද, එසේ කටයුතු කරන දෙපාර්තමේන්තු නිලධාරීන් 70 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණි. | බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට ඇප තැබිය යුතුවීම. | |
| (ආ) | මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තු ප්‍රතිශෝධනය කර එම වාර්තා සෑම වර්ෂ 03 ක් අවසානයේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කර යුතු වුවත් එසේ කර නොමැති බව නිරීක්ෂණ විය. | ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තු ප්‍රතිශෝධනය කර එම වාර්තා සෑම වර්ෂ 03ක් අවසානයේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවීම. | මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තු ප්‍රතිශෝධනය කර එම වාර්තා සෑම වර්ෂ 03ක් අවසානයේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------------------- |
| (අ) | මුදල් රෙගුලාසි 835 (ඇ) ප්‍රකාර පෞද්ගලික පාර්ශවයෙන් ගොඩනැගිලි කුළියට ගැනීමේදී රජයේ තක්සේරුකරුගෙන් වටිනාකම පිළිබඳ තක්සේරුවක් ලබාගත යුතු වුවද, වර්ග අඩියක කුළිය වාර්ෂිකව සියයට 5 ක් බැගින් වැඩිවන පරිදි පෞද්ගලික තක්සේරුකරුවකුගෙන් 2016 වර්ෂයේදි ලබාගත් තක්සේරුවක් මතගෙවීම් කර තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී වර්ග අඩියකට රු. 219.30ක් බැගින් වර්ග අඩි 17,405 ක් සඳහා වසරකට (බදු සහිතව) රු.45,802,860 ක් ගෙවීම් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ මිලදීගත් එම ගොඩනැගිල්ලෙහිම වර්ග අඩි 3048 ක් සඳහා රජයේ වාර්ෂික තක්සේරුව , රු. 6,000, 000 ක් වූ බැවින් වර්ග අඩියක් සඳහා රු.164 ක් වී තිබුණි. ඒ අනුව රජයේ තක්සේරුවක් නොමැතිව ලබාගත් ප්‍රමාණයට වර්ග අඩියකට රු.55.3ක් බැගින් වැඩියෙන් ගෙවා තිබුණි. | ගොඩනැගිලි කුළිය ගෙවීම මුදල් රෙගුලාසිවලට අනුකූලව විය යුතු වීම. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණයවීම නිසා ඇති වූ වන තනතුරු සඳහා 2017 වර්ෂයේදී කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලෙහි දිගුවක් වශයෙන් නව ඉඩ පහසුකම් ලබා ගන්නා ලදී. පසුව නව කොටස සඳහා රජයේ තක්සේරුවක් ලබා ගන්නා ලදී. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | අපේක්ෂිත තනතුරු සඳහා නිලධාරීන් පත් කර එවා නොතිබීම නිසා සමාලෝචිත වසරේ කාර්යාල ගොඩනැඟිලි කුලී , කාමර වෙන් කිරීම් , දුරකථන පද්ධති හා ලී බඩු උපකරණ යනාදිය මිලදී ගැනීම් සඳහා දැරූ රු. 13,598,181 ක වියදම් ඵලදායී ලෙස යොදාගැනීමට නොහැකි වී තිබුණි . | රජයට වඩාත් ඵලදායි ලෙස වියදම් දැරිය යුතු වීම. | 2020.02.06 වන දින සිට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පැමිණීම නිසා එම කාමරය භාවිතයේ පවතී. තවද, රබර් සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය) නව බඳවා ගැනීම්වලින් රබර් සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය) කාමර පිරවීමට කටයුතු කරනු ඇත. මේ වන විට ඇගල් ඔය තවානේ තවාන් කළමනාකරු ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරී මහතා ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරී ලෙස 2020.03.16 දින සිට අනුයුක්ත කරනු ඇත. තවද, සහකාර අධ්‍යක්ෂ නිල කාමරය සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙකු මේ වන විට පැමිණ ඇත.<br>ව්‍යාප්ති අංශය සඳහා එක් ලිපිකරුවෙකු පත් කර ඇති අතර, උපාධිධාරීන් ලැබුණු පසු ව්‍යාප්ති අංශය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරමි.<br>ඒ අනුව කාර්ය මණ්ඩලවල හිඟතාවය හේතුවෙන් ඌන උපයෝජනය වූ ඉඩ ප්‍රමාණයට දැනටමත් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ප්‍රසම්පාදන අංශය, ව්‍යාප්ති අංශය යන කොටස් ස්ථාපිත කොට ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් සමාලෝචිත වර්ෂයේ ඇති කළ අතිරේක අධ්‍යක්ෂක ජනරාල් තනතුර හා ප්‍රාදේශීය අධ්‍යක්ෂක තනතුරු 04 කට අයත් තනතුරුද ඇතුලත්ව ගණකාධිකාරී තනතුරු 02 ක්, නීති නිලධාරී තනතුරු 01 ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුර හා සහකාර අධ්‍යක්ෂක තනතුරු 2019 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතිණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සම්පූර්ණ වී ඇති අතර, අනෙකුත් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. |
| (ආ) | ප්‍රාථමික මට්ටමට අයත් රියදුරු තනතරු 14 ක පුරප්පාඩු විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබුණු පසු කටයුතු කරනු ලැබේ. |